# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

# උපකුලපති තනතුර සඳහා අයදුම්පත්‍ර/ නාමයෝජනා කැඳවීම

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 34 වන වගන්තියේ සහ එහි තදනන්තර සංශෝධනවල නියමයන් ප්‍රකාරව, ශ්‍රී ජයවර්ධපුර විශ්වවිද්‍යාලයේ පාලක සභාව, උපකුලපති තනතුර සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් හා නාම යෝජනා කැඳවනු ලැබේ.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත අනුව උපකුලපති පූර්ණ කාලීන නිලධාරියෙක් වේ. ඔහු / ඇය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධාරියා හා ගණන් දීමේ නිලධාරියා වේ. ඔහු/ ඇය නිල බලයෙන් පාලක සභාවේ හා සනාතන සභාවේ සාමාජිකයෙක් හා සභාපති ද වේ.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත අනුව උපකුලපති කලින් ඉවත් කලහොත් හෝ සේවය අත්හැරියහොත් හැර වසර තුනක කාලයක් සඳහා පත් කරනු ලබන අතර, ඔහු/ ඇය වයස අවුරුදු 65 සම්පූර්ණ වනතුරු හෝ උපකුලපති තනතුරේ කාලය අවසන් වනතුරු හෝ යන දෙකෙන් පූර්වයෙන් එළඹෙන දිනය තෙක් සේවය කල යුතු වේ. අයදුම්කරුවන් / නාමිකයන් වයස අවුරුදු හැට තුන (63) ට අඩු විය යුතුය.

උපකුලපතිවරයා අධ්‍යයන කටයුතු මෙහෙයවීම, කළමනාකරණ ප්‍රතිපත්ති හඳුන්වා දීම හා පාලක සභාවේ තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු වේ. ඔහු / ඇය විශ්වවිද්‍යාල සාමාන්‍ය පරිපාලන, අධ්‍යයන විශිෂ්ඨත්වය, පාරදෘශ්‍ය භාවය, වගකීම, ප්‍රජාතාන්ත්‍රික කළමනාකරණය හා සඵල අපක්ෂපාති නායකත්ව මූලධර්ම උත්ථම්බනය කරනු ලැබේ.

ප්‍රබල පර්යේෂණ පැති කඩක්, ප්‍රත්‍යක්ෂ නායකත්ව ගුණාංග හා විවිධ අභිරුචි කණ්ඩායම් සමග වාස්තවිකව ගනුදෙනු කල හැකි අන්තර් පෞද්ගලික නිපුණතා, ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් පැහැදිලි අවබෝධයක් හා තීරණ සඵල පරිදි ක්‍රියාත්මක කිරීමේ කැපවීම ඇතුළු උසස් ශාස්ත්‍රාලීය ජයග්‍රහණ වාර්තාවක් සාර්ථක අපේක්ෂකයා සතුව තිබිය යුතු වේ. ප්‍රජාව කෙරෙහි ප්‍රයාපනය ඇතුළු විශ්වවිද්‍යාලයක ගුණාත්මක භාවය හා මෙහෙවර පිළිබඳව ගැඹුරු අවබෝධයක් ඔහු / ඇය වෙත තිබිය යුතුය.

පාලක සභාව විසින් අයදුම්කරුවන්/ නාමිකයන් පහත කරුණු යටතේ ද්විත්ව ඇගයීම් ක්‍රමයක් පදනම් කර ගනිමින් නිර්දේශ කිරීම සිදු කරනු ඇත.

i. කේන්ද්‍රීය උපායමාර්ග
ii. ඵලදායී නායකත්ව
iii. සමස්ත චින්තනය / සංකල්පීය කුසලතා
iv. අධ්‍යයන හා පර්යේෂණාත්මක විශිෂ්ඨත්ව
v. පෞද්ගලික අවංකභාව
vi. වෘත්තීය සත්තිවේදනය
vii. කළමනාකරණ නිපුණතාව

(අයදුම්පත්‍ර හෝ නාම යෝජනා සඳහා විස්තර **http://www.sjp.ac.lk** වෙබ් අඩවියට පිවිසීමෙන් ද ලබාගත හැක)

උපකුලපති තනතුර සඳහා සුදුසුකම්ලත් සියලුම අයදුම්කරුවන් / නාමිකයන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා ඇගයීම් කමිටුව කැඳවනු ලැබේ. යම් අයදුම්කරුවකු/ නාමිකයකුට ඇගයීම් කමිටුවට පැමිණිය නොහැකි වේ නම් ඔහු/ ඇය වීඩියෝ සම්මන්ත්‍රණ මගින් සහභාගි විය හැකිය. ඇගයීම් කමිටුව විසින් තෝරා ගන්නා ලද අයදුම්කරුවන් තිදෙනෙකු (03) තෝරා ගැනීම වෙනුවෙන් පැවැත්වෙන ඡන්ද විමසීම ආරම්භ කිරීමට ප්‍රථම සෑම අයදුම්කරුවකුටම පාලක සභාවේ අදහස් ඉදිරිපත් කිරීමට විනාඩි දහයක (10) ක හෝ උපරිම විනාඩි පහළොවක (15) කට යටත්ව ආරාධනා කරනු ලැබේ.

මේ සම්බන්ධව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2020.05.04 දින නිකුත් කර ඇති චක්‍රලේඛ අංක 02/2020 හි සඳහන් උපදෙස් පරිදි පාලක සභාව විසින් අයදුම්කරුවන්/ නාමිකයන් අතරින් සුදුසුකම් ලැබූ තිදෙනෙකුගේ (03) නම් අනුපිළිවෙලින් තෝරා උපකුලපති තනතුරට පත් කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට ඉදිරිපත් කරනු ලැබේ.

උපකුලපති විශ්වවිද්‍යාලයේ ඉහළම වැටුප් තලයේ තැබීමට හිමිකම් ලබන අතර, අදාල වැටුපෙන් 15% ක සංග්‍රහ දීමනාවක් ලැබීමට හිමිකම් ලබයි.

අයදුම්පත්‍රය හෝ නාම යෝජනා පත්‍රය සමග පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කලයුතු වේ. අයදුම්කරුවන්/ නාමිකයන් විධිමත් හෝ අවිධිමත් අයුරකින් තම දැක්ම පිළිබඳ විස්තරයක් විශ්වවිද්‍යාලයේ පාලක සභාවට ඉදිරිපත් කල යුතුවේ.

1. උපන් දිනය ඇතුළුව අයදුම්කරු / නාමිකයාගේ සම්පූර්ණ ජීව දත්ත තොරතුරු.
2. අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් විශ්වවිද්‍යාලයේ ඉටු කිරීමට බලාපොරොත්තු වන දැක්ම පිළිබඳ ප්‍රකාශයක්
3. උපකුලපති තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඉටු කිරීමට යෝජිත කාර්යයන් පිළිබඳ කෙටි විස්තරයක්
4. අයදුම්කරු/ නාමික දැනට උපකුලපති තනතුර දරන හෝ විශ්වවිද්‍යාලයක උපකුලපති තනතුර හොබවා ඇත්නම්, එම කාලය තුළ සිදු කරන ලද කාර්යයන් පිළිබඳ වාර්තාවක්.
5. නාම යෝජනාවක් නම්, නාමිකයාගේ කැමැත්ත සහිත ලිපියක්.
6. අයදුම්කරු / නාමිකයන් රාජ්‍ය සේවය, සමාගමක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය හැර වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක සේවයෙහි නියුක්ත වන්නේ නම් අයදුම්කරු / නාමිකයා තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ ඇය සේවයෙන් නිදහස් කල හැකි බවට සේවා යෝජකයාගෙන් ලිපියක්.

අයදුම්පත්‍ර හෝ නාම යෝජනා 2020 ජූනි මස 30 දින ප.ව. 3.00 ට හෝ ඊට ප්‍රථම "ලේඛකාධිකාරී, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ" ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ පෞද්ගලිකව පැමිණ භාරදීම සිදුකල යුතුවේ.

අයදුම්පත්‍ර හා නාම යෝජනා අදාල ලේඛන බහාලන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ "**උපකුලපති තනතුර**" ලෙස සඳහන් කල යුතු වේ.

අයදුම්පත්‍ර / නාමයෝජනා භාරගන්නා අවසාන දිනට හා වේලාවට පසුව ලැබෙන අයදුම්පත්‍ර / නාම යෝජනා සලකා බලනු නොලැබේ.

**කේ. ඥානසිරි බ්‍රිටෝ**
**ලේකම් පාලක සභාව හා ලේඛකාධිකාරී,**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,**
**2020.06.03**